

# ජනතාවගෙන් ප්‍රශ්න ජනපතිනියගෙන් පිළිතුරු

**සජීවී රූපවාහිනී සංවාදය**

BKT · 0104
25 . 08 . 2023

ජනාධිපති ලේකම් කාර්යාලය
-5 MAR 2002
පුස්තකාලය

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

සජීවී ව හා ලිපි මගින් ඉදිරිපත් වූ
ජනතාවගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්
ගරු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය
1998. 06 . 14 දින ජාතික රූපවාහිනිය සමග
පැවැති සංවාදාත්මක සාකච්ඡාවෙන්
උපුටා ගන්නා ලදි.

මෙම සාකච්ඡාව මෙහෙයවන ලද්දේ ශ්‍රී ලංකා
රූපවාහිනී සංස්ථාවේ සහකාර අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති)
ටී. එම්. ජී. චන්ද්‍රසේකර මහතා විසිනි.

*ප්‍රශ්නය: බී. කේ. අමරදාස රිච්මන්ඩ් කන්දේ සිට: ආර්ථික සංවර්ධනය 4.6%ක්. රැකියා හිඟය 3% කින් අඩු වෙලා, අය වැය හිඟය අඩු වෙලා, උද්ධමනය පහළ බසිනවායි ඔබ නිතර කියනවා. මේ කිසි දෙයක් අපට දැනෙන්නේ නැහැ. දැනිලත් නැහැ. අපට දැනෙන්නේ අපේ මාසේ පඩිය සතියෙන් ඉවර වෙන එක විතරයි. මේ ගැන පැහැදිලි කිරීමක් අපි බලාපොරොත්තු වෙනවා.*

ජනාධිපතිනිය: අත්තිවාරමේ සිට ම කඩා වැටී තිබුණු ගෙයක් හා සමාන ආර්ථිකයක් හාර ගන්නයි අපට සිද්ධ වුණේ. ඒ ගෙයි අත්තිවාරම සම්පූර්ණයෙන් ම දෙදරලා, කුලුනු කඩා වැටිලා, වහල සම්පූර්ණයෙන් බිමට පහත් වෙලා. මෙ වැනි තත්වයක ආර්ථිකයකුයි අපට ලැබුණේ.

අපි රට බාරගත් අවස්ථාවේ දී අයවැය පරතරය රටට දරාගන්න බැරි තරමට විශාල වශයෙන් වැඩි වී තිබුණා. රටක ආදායමට වඩා

ගන්නට පුළුවන් දේවල් ටික අරගෙන අලුත් ගොඩනැගිල්ලක් හදන්න සිද්ධ වෙන බව. ඒ සැලසුම් කිරීමේ දී අපි ප්‍රමුඛත්වයක් දෙන්න තීන්දු කෙරුවේ පළමුවෙන් ම ශක්තිමත් පදනමක් සඳහා. ඉතින් ඒ ආකාරයට පදනම ශක්තිමත් කරන්නට අපට යම් යම් දේවල් කරන්නට සිදු වුණා.

ප්‍රශ්නය: ජනාධිපතිතුමියනි. ඒ පදනම මත සැකසුණු ආර්ථික වැඩපිළිවෙළේ ඵල ප්‍රයෝජන ලබන නිශ්චිත කාලයක් පිළිබඳ අදහසක් තිබෙනවා ද?

ජනාධිපතිනිය: පැහැදිලි ව ම තිබෙනවා. අපි වසර 6කටයි බලයට ආවේ. ඒ වසර හය ඇතුළත, ශක්තිමත් පදනමක් මත ආර්ථිකය ඉදිරියට යන තත්වයකට ගෙනැවිත්, අඩු ආදායම් තත්වය නැති කොට, ජීවන වියදමට මුහුණ දීමට හැකි ශක්තිය වැඩි කිරීමට, රැකියා විරහිත භාවය විශාල ප්‍රමාණයකින් අඩු කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

කඩා වැටී තිබූ කෘෂිකර්මය නැවත වතාවක් සැලසුම් සහගත ව, අද තිබෙන විවෘත ආර්ථිකයට මුහුණ දීමට පුළුවන් වන පරිදි නවීන පදනමක් මත සංවර්ධනය කරනවා.

පසුගිය රජය යටතේ කර්මාන්ත අංශය යම් කිසි සංවර්ධනයක් ලබා තිබුණා. ඒත්, මෙය තවත් ශක්තිමත් කර, අනෙකුත් සංවර්ධන ක්ෂේත්‍ර සංවර්ධනය කිරීමට යටිතල පහසුකම්, පාරවල්, විදුලිය, ටෙලිෆෝන් පහසුකම් ආදිය සංවර්ධනය කරන්නට සැලසුම් කළා.

ප්‍රශ්නය: මේ රජයේ 2/3ක කාලයක් ඉක්ම ගොස් තිබිය දී, ඔබ ඉදිරිපත් කළ ආර්ථිකමය ,සංවර්ධනමය කටයුතුවල ඵලදායී තත්වය පිළිබඳ ව ඔබ තෘප්තිමත් වෙනවා ද. ?

ජනාධිපතිනිය: ඔවු! ඇත්ත වශයෙන් ම ඉතා මත් සතුටු වෙනවා. මොකද? යුද්ධයක් කරද්දීත් අයවැය පරතරය විශාල වශ...

කරන්නට අපට හැකි වුණා. සියයට 10යි දශම ගණනක් වූ අයවැය පරතරය සියයට 8ට අඩුවෙන් තබාගැනීමට වසර 3ක් වැනි ඉතා කෙටි කාලයක් තුළ පුළුවන් වී තිබෙනවා.

උද්ධමන වේගය අඩු කරන්නට ඒ තුළින් පුළුවන් වුණා. හුඟ දෙනෙක් නොකියන දෙයක් ගත්තොත්, ඒ කියන්නෙ 1990වේ සිට මේ දක්වා වසර 8ටේ බඩු මිල, වැඩි වීමේ අනුපාතය ගත්තොත්, ජනතාවගේ එදිනෙදා ජීවිතයට අත්‍යවශ්‍ය වන ආහාර භාණ්ඩ සහ අනෙකුත් භාණ්ඩවල මිල 90 සිට 94 දක්වා ඉතා වේගයෙන් වැඩි වුණත්, දැන් වැඩි වී තිබෙන්නේ ඊට වඩා ඉතා හුඟක් අඩු ප්‍රමාණයකින්. පසුගිය වසර 4 ඇතුළත බඩු මිල වැඩි වී තිබෙන්නේ ඉතා සුළු වශයෙන්.

ප්‍රශ්නය: දුරකථනයෙන් සම්බන්ධ වන දර්ශනී හාමිය රත්න වේයන්ගොඩ සාමය උදා කර ආර්ථිකය නංවනවා කියා බලයට එන විට කීවා. දැන් ආයෙත් යුද්ධය. අපට පේන ආර්ථික සංවර්ධනයකුත් නැහැ. උතුරේ සාමයකුත් නැහැ. ඉදිරි අනාගතයේ දී වත් අපි වගේ අයට වැඩක් වන ආර්ථික සැලැස්මක් තිබේ ද?

ජනාධිපතිනිය: ආර්ථික සංවර්ධනය ඇති කරනවා කියන එක ගහකින් අඹ ගෙඩියක් කඩා ගන්නවා වගේ කරන්න පුළුවන් දෙයක් නො වේ. විනාශ වූ ආර්ථිකයක් භාර ගත් අපි එය සම්පූර්ණයෙන් ම හොඳ අතට හැරවුවා.

මෙ තැන දී මා එකක් කිව යුතුයි. දැන් ඒ කතා කළ මහත්මිය ුද්ධයත්, ආර්ථිකයත් ඉතා කිට්ටුවෙන් සම්බන්ධ කර කතා කෙරුවා. ය සියයට සියයක් හරි. අපි දෙ වන ලෝක යුද්ධය දිහා බලමු. ෝකයේ ශක්තිමත් ම, ආර්ථික වශයෙන් පොහොසත් ම රටවල් ණතාවකුයි මේ ලෝක යුද්ධයට සම්බන්ධ වුණේ. යුද්ධය පැවති ලයේ දී, එංගලන්තය, ප්‍රංශය, ජර්මනිය, ජපානය, ඉතාලිය වැනි වල උද්ධමනය හතර පස් ගුණයකින් වැඩි වුණා. හැම කෙනාට ාහාර අහේණිය දැනුණා. දුප්පත්, පොහොසත් හැම කෙනා ම හැම

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

දා ම සීතලේ හිමේ පැය ගණනක් පෝලිම්වල ඉඳලා, ලබාගත පාන් කෑලි කිහිපයකුත්, අල ගෙඩි කිහිපයකුත් පමණයි. සාමාන්‍යයෙ යුද්ධයක් කරන විට රටක තත්වය ඒකයි. යුද්ධය පටන්ගන්න විට අපි රට බාරගන්න අවස්ථාවේත් අපේ රටේ තිබුණේ ඉතා මත් දුර්ව ආර්ථික තත්වයකුයි . ඒත් ආර්ථිකය ශක්තිමත් කිරීමට අපි විශා වැඩ කොටසක් කළා. අනවශ්‍ය වියදම් කපා හැරියා. කළ වියද සියල්ල ප්‍රතිඵල ලැබෙන වියදම් තත්වයට හැරෙව්වා, ප්‍රතිඵල ලැබෙන ව්‍යාපෘති ආයෝජන සඳහා.

ඒ වගේ ම කලින් කීවා වාගේ ඔය කී කාරණා තුළින් අය වැය පරතරය ද අඩු කරන්නට හැකි වුණා. ඒ නිසා බඩු මිල ශීඝ්‍රයෙන් වැඩි වීම සීමා කිරීමට අපට හැකි වුණා. බැංකු ණය පොලී අනුපාතය ද ඒ තුළින් අඩු කිරීමට හැකි වුණා. සියයට 23ත් 29ත් අතර තිබූ පොලී අනුපාතය අද තිබෙන්නේ සියයට 14ත් 8ත් අතර. මේ විශාල අඩු වීමක්. මේ නිසා, බය නැති ව බැංකුවලින් ණය මුදල් අරගෙන නැවත ආයෝජනය කිරීමට ව්‍යාපාරිකයන් පටන්ගෙන තිබෙනවා. රැකී රක්ෂා විශාල ප්‍රමාණයක් මේ තුළින් ඇති වී තිබෙනවා. රැකියා විරහිත භාවය සියයට 13යි දශම ගණනක තිබුණා. සියයට 10 දක්වා අපි එය අඩු කර තිබෙනවා, ඉදිරියට යන්නේ නැති ව එක තැන පල් වෙමින් තිබූ ආර්ථික සංවර්ධනය මේ වගේ වෙනස්කම් නිසා ඉදිරියට ගෙනයන්නට අපිට පුළුවන් වී තිබෙනවා.

කඩා වැටෙන්නට තිබුණු ගොඩනැගිල්ලට හොඳ පදනමක් දා, ශක්තිමත් කර තිබෙනවා. මේ තත්වය කාට වත් දැනෙන්නේ නැහැ කියා ප්‍රශ්නයක් ඇසීම ගැන මා පුදුම වෙනවා. ගම් ප්‍රදේශවලට යන විට අපට අහන්න ලැබෙන දෙයක්, මෙ තෙක් කල් කිසි ම රජයක් යටතේ නොකෙරුණු තරම් වේගයෙන් සංවර්ධන කටයුතු සිදු වෙලා තිබෙනවා කියන එක. ඒ කියන්නේ පාරවල්, පාලම්, බෝක්කු විදුලිය විශාල වශයෙන් ලබා දී තිබෙනවා. ටෙලිෆෝන් පහසුකම්, සුළු වාරිමාර්ග හා මධ්‍යම පරිමාණයේ වාරිමාර්ග ව්‍යාපෘති 950ක් අපි අවසන් කර තිබනවා. වියළි කලාපයේ සහ අතරමැදි කලාපයේ, කුරුණෑගල වැනි දිස්ත්‍රික්කවල, අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශාල වර්ධනයක් ඇති වී තිබෙනවා.

ප්‍රශ්නය: පාද්දුවේ කුමාරි අමරසූරිය : අල්ලස හා දූෂණය නැවතත් හිස ඔසවන බව පුවත්පත් මගින් දැනගන්නට ලැබෙනවා. 'එයා ලංකා' ගනුදෙනුව ගැන ඔබ තුමියටත් ඇඟිල්ල දිගු කොට, තිබෙනවා. පසුගිය රජය සමයේ දූෂණවල යෙදුණු, ඉඩම් කොල්ල කෑ, බැංකු වංචා කළ අය තව මත් නිදැල්ලේ පසු වෙනවා. කොමිෂන් සභා වර්තා තව මත් හමස් පෙට්ටියේ. මොනව ද මේ ගැන ඔබතුමිය කියන්නේ?

ජනාධිපතිනිය: ප්‍රශ්නයේ දෙ වන කොටසට අනුව පසුගිය රජය සමයේ දූෂණ කරපු අය නිදැල්ලේ ඉන්න බව සඳහන් වෙනවා. ඇත්ත වශයෙන් ම මේ රටේ ජනතාව අපෙන් ඉල්ලුවේ ප්‍රජාතන්ත්‍රවාදයයි. ප්‍රජාතන්ත්‍රවාදී රජයක් අපි පිහිටුවල තිබෙනවා, පෞද්ගලික ව හා නොයෙක් ආකාරයේ විශාල කැප වීම් කරලා. එක පැත්තකින් එල් ටී. ටී. ඊ තර්ජනයක් තිබුණා වගේ ම, එල්. ටී. ටී. ඊ ය තරම් ම දරුණු දේශපාලන මාෆියාවක් පසුගිය රජය විසින් අපේ ප්‍රදේශවල ගොඩනගා තිබුණා.

ඒ වගේ ම විශාල ලෙස අනිසි ප්‍රයෝජන ගත් ව්‍යාපාරිකයින් කොටසක් ද සිටියා. මේ අය පෞද්ගලික මාෆියාවන් තියාගෙන, අවි ආයුධ තියාගෙන බලවත් ව සිටියා. මේ අයගේ තර්ජනවලටත් මුහුණ දී අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය නැවත වතාවක් ගොඩනැඟීමට අපට හැකි වුණා.

ප්‍රජාතන්ත්‍රවාදී ව අපි කටයුතු කරනවා නම්, කවුරු හෝ වැරැද්දක් කරනවා කියා දැනගත් පළියට, ඒ අය උස්සාගෙන ඇවිත්, හිරේ දා, එහෙම නැත් නම් ටයර් සෑයවල් උඩ පුච්චා දමන්නට බැහැ, පසුගිය රජය කළාක් මෙන්. රටේ ප්‍රජාතන්ත්‍රවාදය උඩ අප ක්‍රියාත්මක වෙනවා නම් රටේ නීතියක් තිබෙනවා. ඒ නීතියට අනුකූල ව අපි කටයුතු කළ යුතුයි.

මේ රටේ නීතිය ක්‍රියාත්මක කෙරෙන්නේ ඉතා හෙමින්. එ තැන දී මා කිය යුතු ඇත්තක් ද තිබෙනවා. අපේ නීති ක්ෂේත්‍රය, අධිකරණය එජාප රජය කාලයේ දී ඉතා මත් දූෂ්‍ය වෙලා තිබුණා. මා ඊට වඩා

කියන්නට අවශ්‍ය නැහැ. ජනතාවට එය ළඟ දී ම හෙළි වේ වි. ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු විනිසුරුවරුන් 11 දෙනකු පැය 24කින් ගෙදර යවලා, වෙනත් පත්වීම් සිදු කෙරුණා. තව මත් ශ්‍රේෂ්ඨාධිකරණයේත් අනෙක් තැන්වලත් ඒ අය තව මත් ඉන්නවා. නීතිය බලාපොරොත්තු වෙන්න ඕනැ මේ අයගෙනුයි.

ජනතාව ඉතා උස් හඬින් අපට කියා හිටියේ මේ භීෂණකාරී යුගය නැති කරන්න කියලයි. භීෂණය නැති කිරීමට නම් රටේ නීතිය ක්‍රියාත්මක කරන්න ඕන. අර අප කී අඩුපාඩුකම් තිබුණත් අප මේ නීතිය ක්‍රියාත්මක කෙරුවේ නැත් නම් මේක කො තැනින් ඉවර වෙනවා ද කියන්න බැහැ. ඒ නිසා, මේ වැරැදි කළ අයට විරුද්ධ ව එක පැත්තකින් අපි නීත්‍යානුකූල කටයුතු කරනවා. නීතිය ඉතා හෙමින් ක්‍රියාත්මක වන නිසා විශේෂ ජනාධිපති කොමිෂන් සභාව වැනි ආයතන ඇති කර නීතිය ඉක්මන් කරවීමටත් අපි කටයුතු කර තිබෙනවා.

උදහරණයක් ලෙස, උතුරේ යුද්ධයට සම්බන්ධ නැති ව අතුරුදන් වූ 50000ක් පමණ තරුණයින් පිළිබඳ ව සොයා බැලීමට අපි කොමිෂන් සභා 3ක් පත් කළා. ඒ කොමිෂන් සභා වාර්තා තුන ම අවුරුද්දකට පෙර මට ලැබුණා. ඒ කොමිෂන් වාර්තාවලට අනුව 30000 පමණ අතුරුදන් වූ බව ඔප්පු වී තිබෙනවා. ඒවාට සම්බන්ධ දේශපාලනඥයින් හා නිලධාරින් හඳුනාගෙන ඒ අයට එරෙහි ව දැන් නඩු සිය ගණනක් පවරා තිබෙනවා. ඉතුරු අයට ද එරෙහි ව නඩු පවරාගෙන යනවා.

මේවා කිරීමේ යම්, ක්‍රියාදාමයන් තිබෙනවා. අපි නම් මිනී මරන්නට, ටයර් සෑයවල් හදන්නට කැමති නැහැ. මේ තරම් ජනතා ද්‍රෝහිකම් කළ අයට එරෙහි ව කටයුතු කිරීමට අපටත් විශාල වුවමනාවක් තිබෙනවා. ඒත් රටේ පවතින නීතිය අනුව කටයුතු කරන්න ඕන. දැන් එය කෙරීගෙන යනවා. මොකුත් කෙරෙන්නේ නැහැ කීම නම් වැරදියි.

දූෂණය කියන එක මට පෞද්ගලික ව පෙන්නන්න ම බැහැ. මා එය මේ රටෙන් ඉවත් කරනවා කියා පොරොන්දු වුණා. රටේ

ජනාධිපති විශේෂයෙන් ම මේ කාරණා දෙකට ම අනුබල නො දී කටයුතු කළ යුතුයි. රටේ ජනාධිපති හැටියට මම මේ අනුව මේ දක්වා වැඩ කර ඇති බව සහතික ව කියන්න පුළුවන්. ඒත්, ඒ මදි. හොරකම් නොකරන බවට ඇමතිවරුන් වග බලාගන්න ඕනැ. හොරකම් නොකරන බවට රටේ ප්‍රධාන නිලධාරින් වග බලා ගන්න ඕනැ. ඒ ටික ඇත්ත වශයෙන් අපට සහතික කරගන්න පුළුවන් නම්, ඊ ළඟ මට්ටම්වල සිටින අයගේ හොරකම, දූෂණය සීමා කිරීම, නැති කිරීම ඊට වඩා පහසු වෙනවා.

***ප්‍රශ්නය:* කේ. පී. ප්‍රේමදාස බලන්ගොඩ සිට: අල්ලස හා දූෂණ ගැන පුනපුනා කතා කරන ඔබතුමිය අල්ලස හා දූෂණ කොමිෂම අකර්මණ්‍ය වීමට ඉඩ හැර ඇත්තේ ඇයි?**

***ජනාධිපතිනිය:*** මම එය අකර්මණ්‍ය වීමට ඉඩ හැර නැහැ. මම නැවත නැවත ම ඒ අයට කීවා කොමිෂම හරියට ක්‍රියාත්මක කරන්නට කියා. ඒත්, අපෙන් ද වැරදි සිදු වුණා. අල්ලස් හා දූෂණ කොමිෂන් සභාවට විශ්‍රාම ගිය විනිශ්චයකාරවරුන් පත් කිරීමයි සාමාන්‍යයෙන් කෙරෙන්නේ. විශ්‍රාම ගිය විනිශ්චයකාරවරුන් අතර සුදුසු අය හිටියේ ටික දෙනයි. එක එක්කෙනාගේ දේශපාලනය බලන්න වත්, අල්ලස් හා දූෂණ කොමිෂන් සභාව දූෂ්‍ය කරන්න වත් මගේ කිසි ම බලාපොරොත්තුවක් නොතිබූ නිසා යෝජනා වූ පුද්ගලයා බඳවාගත්තා. ඒ තැනැත්තා අවු. 75කට වැඩියි. කටයුතු කරන්නේ බොහෝ ම හෙමින්. තවත් හිටපු පොලිස්පතිවරයකු ගත්තා. ඇත්ත වශයෙන් ම විපක්ෂයට බොහොම කිට්ටු කෙනෙක්. ඒත්, එය දැනගෙනත් අපි ගත්තා. අපේ අපක්ෂපාතී භාවය නිසා. ඒත්, මේ කොමිෂම අවුරුදු 2 1/2 ක් 3ක් තිස්සේ කළ දෙයක් නැහැ. මෙය මට ද ඇත්ත වශයෙන් ලොකු ප්‍රශ්නයක් වුණා. මීට වඩා හොඳට වැඩ කරන ලෙස ඔවුන්ට මා ලිඛිත ව දන්වා සිටියා. මේ අය පාසල් ළමුන් වගේ එහි අධ්‍යක්ෂ ජනරාල්වරිය සමඟ ගැටෙන්නට ගිය අවස්ථාවේ එය විසඳන්නට මා උත්සාහ කළා. ඒ අයගේ ක්‍රියාමාර්ගවලට බලපෑම් කළේ නැහැ. කටයුතු ඉක්මන් කිරීමට බැලුවා. ඒත් හරිගියේ නැහැ. අප බලාපොරොත්තු වූ ආකාරයට ක්‍රියා

කරන්න අල්ලස් හා දූෂණ කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන් සම්පූර්ණයෙන් ම අසමත් වුණා. යම් යම් දේශපාලන බලපෑම් තිබෙනවා ද, මේවාට මොන මොන හේතූන් තිබෙනවා ද කියා මා දන්නේ නැහැ. දන්නේ නැහැ මයි කියා කියන්නත් බැහැ. අවිශ්වාස කරන්න හේතු තිබෙනවා.

කෙ සේ වෙතත් ජනතාවට වගේ ම මටත් අපේ රජයටත් ඉතා මත් අවශ්‍ය වී තිබෙන්නේ පහුගිය කාලයේ සිදු වූ දූෂණ සොයා බලන්නයි. මේ යුගයේ සිදු වන දූෂණ තුන නවත්වාලන්නයි. මේ සඳහා අපි කොමිෂන් සභාව පත් කළා. ඒත්, එය අක්‍රියයි. එතකොට මා මොකද කරන්නේ ?අපි රජයේ නිලධාරියකු පත් කළා ම ඒ නිලධාරියා හොරකම් කළොත් අස් කරනවා. ඒත්, හොරකම් නැති වුණත් නිලධාරියා අක්‍රිය නම් අපි හොඳින් කියනවා, අස් වෙලා ගෙදර යන්න කියා. ඉතා ඉහළ මට්ටමේ හිටපු නිලධාරීන්ට මා එහෙම කියලා තිබෙනවා. හොරකම් නොකරයි කියන විශ්වාසය උඩ සහ හොඳින් ක්‍රියා කරයි කියන විශ්වාසය උඩ අපි නිලධාරීන් පත් කරනවා. ටික කලක් පරීක්ෂාවෙන් සිට වැඩ අකාර්යක්ෂම නම් ඉහළ මට්ටමේ නිලධාරීන් ගෙදර යවා තිබෙනවා. හොරකම් කළ අය ගැන ඊට වඩා තදින් ක්‍රියා කර ගෙදර යවා තිබෙනවා. වැඩ කරන්න බැරි නම් මේ අයටත් බොහොම හොඳින් කියනවා ගෙදර යන්න කියා. මොකද, අපට වුවමනාවක් තියෙනවා, මීට වඩා හරියට ක්‍රියාත්මක වන අල්ලස් හා දූෂණ කොමිෂන් සභාවක් පවත්වාගෙන යන්න.

*ප්‍රශ්නය: මීගමුවේ දළුපතින් අපට ප්‍රශ්නයක් එවා තිබෙනවා. එයා ලංකා විවාදයේ දී පාර්ලිමේන්තු විපක්ෂ මන්ත්‍රීවරයකුගේ කථාවක දී හඟවා සිටියේ, ඔබතුමිය ස්විට්සර්ලන්තයට ගියේ එයා ලංකා ගනුදෙනුවේ අවසානයේ ලැබුණු මුදල් තැන්පත් කිරීමට කියා.?*

*ජනාධිපතිනිය:* එයා ලංකා ගනුදෙනුව පිළිබඳ ව කියන්නට කලින් ...පෞද්ගලික කරණය ගැන කියන්නට මට සිදු වෙනවා. අපි තව ම ...රි පෞද්ගලික කරණයක් කර නැහැ. ඒ අය රටේ වටිනා සම්පත් ...ම්පූර්ණයෙන් පෞද්ගලික අංශයට පවරා දෙන ව්‍යාපාරයක් ආරම්භ

කර 3/4ක් අවසන් කරලයි තිබුණේ. එජාප රජය රජයේ කර්මාන්ත ශාලා 42ක් ඉතා මත් හොර ක්‍රමයට, ඉතා දූෂ්‍ය ක්‍රමයට, ඒ අයගේ නෑදෑයින්ට හා මිත්‍රවරුන්ට, එහෙම නැත් නම් ඒ අයට අල්ලස් දුන් අයට, රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුවට වැඩිය දහ ගුණයක්, පස් ගුණයක්, හය ගුණයක් අඩුවට ලබා දී තිබුණා. අපේ වටිනා සංස්ථාවල් 42ක්, වටිනා කර්මාන්ත ශාලා 42ක්, නයිලෝන් සිල්ක්, කැලණි ටයර්, ලංකා ලෝහ, යක්කල, මත්තේගම පූගොඩ කම්හල් සිමෙන්ති සංස්ථාවල්, පොහොර සංස්ථාවල් සියල්ල ම පෞද්ගලික අංශයට දුන්නා. රජයේ තක්සේරුකරු කියනවා මිලියන 1000ක් වටිනවා, 1200ක් වටිනවා කියා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා අදාළ ඇමතිවරයා හැටියට කැබිනට් මණ්ඩලයට කොළයක් අරගෙන ගිහින් තීරණය කරනවා, මිලියන 1200ක් වටිනවා කී සමාගම මිලියන 200 කට ලබාදෙමු කියා. මේ අඩු කිරීමට කිසි ම හේතුවක් නැහැ. මෙහි දී කැබිනට් මණ්ඩලය ද හා කියනවා. මිලියන 200ට දෙන්න එකඟ වූ එක දෙන්නේ මිලියන 100කට. ඒ මිලියන 100 ගෙවීමටත් සල්ලි දෙන්නේ රජයේ බැංකු දෙකෙන්. සම්පූර්ණ හොර පෞද්ගලික කරණයක් කර තිබුණා.

කිසි ම දැනුමක් නැති ම. කිසි ම ආර්ථික ශක්තියක් නැති, අතේ, මුදල් නැති බංකොලොත් අයට මේවා දී තිබුණා. අපි බලයට එන විට පෞද්ගලික කරණය කළ සමාගම්වලින් 80%ක් පමණ කඩා වැටිලා, සමහර ඒවා වහලා, අනෙක් ඒවා වහන්න ඔන්න මෙන්න කියා තිබුණා. සේවකයෝ පාරවල් ගානේ බෝඩ් ලෑලි උස්සාගෙන පිකටින් කෙරුවා. ඔවුන්ට පඩි ගෙවා නැහැ මාස ගණන්. මෙ වැනි තත්වයකයි ඒවා තිබුණේ. ඒ ඒ අයගේ පෞද්ගලික කරණයයි. වැරදි විදියට පෞද්ගලික කරණය කළ ඒවාට විශාල මුදලක් වැය කිරීමට අපට සිදු වුණා. වහල තිබුණු සංස්ථාවල සේවකයන්ට අපි බලයට ආ ගමන් පඩි ගෙවන්න පටන් ගත්තා.

සේවකයින්ට මාස ගණන් පඩි ගෙවා, ඒ බංකොලොත් වූ ආයතන මුදල් යොදා නැවත ගොඩනගා, නව ජීවයකින් පවත්වාගෙන යන්න පුළුවන් හොඳ ශක්තිමත් කොම්පැනිවලට බාරදුන්නා. ඒ සේවකයන්

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

සියලු දෙනාට ම ඒ ආයතනවල රැකියා ලබා දී තිබෙනවා. අප අලුතෙන් කැඳවා ගෙන ආ ආයෝජකයන්ගේ මුදල් යොදා, අලුත් යන්ත්‍ර යොදා අද ඒවා ඉදිරියට යනවා.

අපේ පෞද්ගලික කරණය කුමක් ද? අප බලයට එන විට මේ රටේ පෞද්ගලික කරණය කිරීමේ ගමන ආරම්භ කර අවසන්. විවෘත ආර්ථිකය මේ රටේ ස්ථාපිත වී තිබුණා. අපට ඒ ගමන ආ පස්සට හරවන්න ද බැහැ. මුළු ලෝකයේ ම විවෘත ආර්ථිකය ස්ථාපිත වෙලා. සමාජවාදී ලෝකයේ ආර්ථිකය කඩා වැටීමෙන් පසු ව ඒ රටවලුත් අද විවෘත ආර්ථික ක්‍රම වැලඳගෙන. ඒත්, හොර රහසේ කළ මේ පෞද්ගලික කරණ වැඩපිළිවෙළ කොයි ආකාරයෙන් ද කරන්නේ කියා සිතා බලන්න අපට සිදු ව තිබුණා,

අපට රට භාර දෙන වෙලාවේ රජය ද බංකොලොත්. අවුරුදු 11ක් නො කඩවා තිබූ යුද්ධයක් ද මේ රටේ තිබුණා. මේ යුද්ධය හරියාකාර ව කරගෙන යන්න, ඒ අය වියදම් කළා වගේ දෙ ගුණයක් අපි දැන් වියදම් කරනවා. බිලියන 23ක් වියදම් කළ යුද්ධයට දැන් බිලියන 50ක් වියදම් කරනවා. ඒ දෙ ගුණයකටත් වැඩියි. එතකොට ජනතාව ඉල්ලන්නේ අවුරුදු ගණනාවක් නොකෙරුණු සංවර්ධනයක්. විදුලිය, පාසල්, රෝහල් සහ රැකියාවල්. මේවා ලබාදීමට මුදල් කොහෙන් ද ? ඒ මුදල් ලබාගැනීම සඳහා රජය කොහෙන් හෝ මුදල් උපයන්නට ඕන, රජයකට මුදල් උපයන ක්‍රම ද ඉතා සීමිතයි. අපි මේ මුදල් සොයාගන්නේ කොහොම ද? එක්කෝ බදු වැඩි කරන්නට ඕනැ. බදු වැඩි කළ හොත් ඒ පැත්තෙන් කෑ ගසනවා. ඒ අය උපයන පළියට ඒ අයගේ සියලු මුදල් රජයට ගත්තොත්, රටේ සංවර්ධනයක් ඇති වන්නේ නැහැ. රටේ සංවර්ධනයක් ඇති කිරීමට ඒ අයගේ අතේ මුදල් ඉතිරි වන්නේ නැහැ.

රජයේ වත්කම් නිසි පිළිවෙළට විකිණීමෙන් හෝ මිල කිරීමෙන් හෝ රජයට ආදායමක් ලබාගැනීම රජය මුදල් උපයන තවත් ක්‍රමයක්.

අද රැකි රක්ෂා නැහැ කියා කෑගසනවා. ඒත් රැකි රක්ෂා ඇති කිරීමට, පෞද්ගලික අංශයෙන් රැකියා සැපයීමක් ගැන සිතන්නේ නැති

ව, රජයෙන් ම රැකියා දෙනවා කියා හිතුවොත්, රජය තවතවත් නව ව්‍යාපෘති ඇති කරන්නට ඕනෑ. ඒ නව ව්‍යාපෘති ඇති කිරීමට මුදල් හොයන්නේ කොහෙන් ද? ඒ නිසා, වැදගත් තීන්දුවක් ගන්නට අපිට සිදු වුණා. කලින් වගේ කුණුකොල්ලයට විකුණා කාබාසිනියා කරන්නේ නැති ව, රජයේ වත්කම්වල කොටස් ප්‍රමාණයක් අපි විකුණනවා. ටෙලිකොම් හා එයා ලංකා කියන දෙක ම අපි පෞද්ගලික කරණය කර නැහැ. ඒත්, වානේ සංස්ථාව පෞද්ගලික කරණය කළා. එය සම්පූර්ණයෙන් ම කොරියන් කොම්පැනියකට විකුණුවා. ටෙලිකොම් ආයතනයේත්, එයා ලංකා ආයතනයේත් සියයට 35ක සියයට 40ක කොටස් විකුණුවා. සියයට 60කට ප්‍රමාණයක වැඩි අයිතිය තියෙන්නේ රජයට. ඒ නිසා, තීරණ ගැනීමේ වැඩි අයිතියක් තිබෙන්නේ අපට. ඒත්, අනෙකුත් සංවර්ධන කටයුතු සඳහා, තරුණ පරම්පරාව ඉල්ලන රැකියා ඇති කිරීම සඳහා අලුතෙන් ව්‍යාපෘති ඇති කිරීම සඳහා අපට මුදල් අවශ්‍යයි. මේ මුදල් ලබාගැනීම සඳහා ටෙලිකොම් ආයතනයේ කොටස් 35%ක් පෞද්ගලික අංශයට විකුණුවා. එයා ලංකා සමාගමේ කොටස් 40%ක් ටෙන්ඩර් පටිපාටිවලට අනුව හොඳ ම ඉල්ලුම්කරුවාට විකුණා විශාල මුදලක් උපයාගත්තා. ටෙලිකොම් ආයතනයේ කොටස් 35%ක් විකුණා ඇමරිකන් ඩොලර් මිලියන 225ක් හොයාගත්තා.

***ප්‍රශ්නය:* බොහෝ අය කියනවා මේක ජාතික සම්පත් විකුණාගෙන කෑමක්
කියා ?**

***ජනාධිපතිනිය:*** අපි විකුණාගෙන කන්නේ නැහැ. විකුණා ඒ මුදල් ජනතාවට දෙනවා. ඇත්ත වශයෙන් ම ටෙලිකොම් ආයතනයට සම්බන්ධ වුණේ ලෝකයේ තිබෙන විශාලතම ප්‍රධානතම ජපන් සමාගම වන එන්. ටී. ටී. සමාගමයි. බත් පැකට් බදින කෙනකුට ලංකා ලෝහ සංස්ථාව දුන්නා වගේ නො වෙයි. මුලින් ටෙලිකොම් ඉල්ලුවේ මිලියන 140කට පමණයි. සාකච්ඡා කර, ඒ අයට බල කර මිලියන 225ක් අපි ලබාගත්තා.

වරාය අපි පෞද්ගලික කරණය කරන්නේ නැහැ. ඒත්, අපට වරාය සංවර්ධනයට විශාල මුදලක් අවශ්‍යයි.

අපි මේවා තුළින් කර තිබෙන්නේ මේ අත්‍යවශ්‍ය ක්ෂේත්‍ර සංවර්ධනය කිරීම සඳහා රජයට ජනතාවට රටට නැති මුදල් තියෙන තැන්වලින් ලබාගැනීමක්. දෙ වනු ව, අපට නැති ඉතා මත් දියුණු ම තාක්ෂණය ඒ අය මාර්ගයෙන් ලබාගැනීම. ඒ සඳහා ද මුදල් අවශ්‍යයි. අපේ රටේ තිබෙන ලොකු ම දුර්වල අංශයක් වන කළමනාකාරිත්වය ලබාගැනීම. ලාංකිකයන් බොහෝ දක්ෂ වුණත්, කළමනාකාරිත්වය අතින් හුඟ දෙනෙක් දුර්වලයි. මේ නිසා නවීන කළමනාකාරිත්වය ඒ සමාගම්වලින් අරගෙන, ඒ ආයතන විධිමත් කර, දිරිමත් කර, ශක්තිමත් කර ජනතාවට වැඩි ආදායමක් ලබාදෙන්න ඉදිරියට ගෙනයනවා. සීමිත කොටස් ප්‍රමාණයක් විකිණීමෙන් රජයට, භාණ්ඩාගාරයට ලැබෙන මුදලට අමතර ව, තවත් වාසියක් ද දිගින් දිගට ම ලැබෙනවා. ටෙලිකොම් එකේ, එයා ලංකා එකේ අපිට වැඩි කොටසක් අයිති නිසා, අපේ වැඩි කොටසට සමාන ලාභ ප්‍රමාණයක් අපට ලැබෙනවා. එයා ලංකා සමග එමිරේට්ස් වුණා. අපට නොතිබුණ කළමනාකරණයක් මේ අය ගෙනවිත් තිබෙනවා. ඒ සාර්ථක පාලනය තුළින් ලබන ලාභවලින් සියයට 60ක් ලංකා ආණ්ඩුවට ලැබෙනවා. අප මුල දී ලැබූ ඩොලර් මිලියන 70ට අමතර ව හැම වර්ෂයක් පාසා ම ටෙලිකොම් එකෙන්, එයා ලංකා එකෙන් 60%කට සමාන ලාභයක් අපේ භාණ්ඩාගාරයට උපයාගන්න පුළුවන්. ව්‍යාපාර කටයුතු වැඩි වීම තුළින් අපිට ලැබෙන ලාභවලට අමතර ව හරි කළමනාකාරිත්වය තුළින් ද වැඩි ප්‍රතිලාභයක් ලබාගත හැකියි. ටෙලිකොම් ආයතනය අපි තනි ව පවත්වාගෙන ගියා නම් අවුරුද්දකට දෙන්න වෙන්නේ ටෙලිෆෝන් 50000ක් 100000 ක් පමණයි. ඒත්, මේ අයගේ කළමනාකාරිත්වය හා විශාල මුදල් යෙදවීම නිසා ටෙලිෆෝන් ලක්ෂ 2ක් 3ක් දෙන්න පුළුවන් වුණා. එ තැනින් ද වැඩි ආදායමක් ලැබෙනවා. අපේ වැඩි කොටසට සමාන කොටසක් එයින් ලැබෙන ආදයමෙන් ද අපට ලැබෙනවා. එයා ලංකා සමාගමේ තත්වය ද ඒකයි.

එයා ලංකා ආයතනය පෞද්ගලික කරණය කරන්නට සිදු වුණේ ඇයි කියා පැහැදිලි ව ජනතාව දැනගන්න ඕනැ. එයා ලංකා ආයතනය 94 දී අපට ලැබුණේ සම්පූර්ණ බංකොලොත් ආයතනයක් විදියටයි. එයා ලංකා ආයතනය අපි පෞද්ගලික කරණය කළේ නැහැ. අපි කළේ තවත් සමාගමක් සමග එකතු වී ඒකාබද්ධ ව්‍යාපාරයක් කිරීමයි. එයා ලංකා ආයතනය පිළිබඳ මේ කටයුත්තට යෙදෙන්නට පෙර එයා ලංකා ආයතනය රුපියල් බිලියන 17000ක් මුදල් ණය වී තිබුණා. ඊට අමතර ව, ගන්නු ණය සඳහා පොලී සහ තවත් ගෙවීම් සඳහා හැම වර්ෂයක් පාසා ම එයා ලංකා තව රුපියල් මිලියන 3000ක ගෙවන්න ඕනැ. හැම වර්ෂයක් පාසා ම ණයට ගෙවන පොලිය සහ ඩොලරයත්, රුපියලත් අතර වන පරතරය නිසා එයා ලංකා ආයතනයට වැඩි අලාභයක් ලබන්න වෙනවා. මේ ණය පොලී ආදිය සඳහා බිලියන 3000ක් යනවා.

එයා ලංකා ආයතනය හැම වර්ෂයක් වර්ෂයක් පාසා ම පවත්වාගෙන ගියේ අලාභයට. රු. මිලියන 450 යි, මිලියන 1000යි, මිලියන 700යි, එයා ලංකා ආයතනයේ ලාභයට ගියේ භාණ්ඩ පරිවහන සහ භෝජන සැපයීම් කේටරින් සර්විස් කියන ආයතන දෙක පමණයි. එයා ලංකා ආයතනයේ එක කොටසක් ලාභයට යනවා, අනෙක් කොටස අලාභයට යනවා කියා වෙන වෙන ම බලන්න බැහැ. ඒ දෙක ම එකට දමා මුළු ආයතනය ම ගත් විට පසුගිය අවුරුද්දේත් මිලියන 450ක අලාභයක් වී තිබෙනවා. ඒ ණය බර මිලියන 17000ට අමතර වයි. ඒ අනුව මේ ආයතනය සම්පූර්ණ බංකොලොත් ආයතනයක්. පරණ ගුවන් යාන 4කුත්, අලුත් ගුවන් යාන 5කුත් එක්ක ගුවන් යාන 9ක ආයතනයක්. මේ එයා ලංකා අයතනය. මහා විශාල ආයතනයක් ද නො වෙයි.

පෞද්ගලික කරණය කිරීමේ දී මේවාට රිංගන්නට කොමිස් අපේක්ෂකයන් එනවා. එයා ලංකා ගිවිසුමේ දී එ සේ කොමිස් ඉල්ලා ලැබී නැති නිසා ලොකු ප්‍රශ්නයක් ඇති වී තිබෙනවා. ඇත්ත වශයෙන් ම එයා ලංකා සමගම මේ විදියට තව අවුරුදු 2ක් ගියා නම් වහන්න සිදු වෙනවා. එයා ලංකා එකේ තිබෙන පරණ ගුවන් යාන හතර අද

මොනවත් කර විකුණන්න බැහැ. එජාප රජය මේ ට්‍රයිස්ටාර් ගුවන් යානා 4 ගත්තේ ඒ සමාගම මෙ වැනි ගුවන් යානා නිෂ්පාදනය නවත්වන යුගයේ දීයි. අද ඒ ගුවන් යානාවලට අමතර කොටස් නැහැ. ඒ ගුවන් යානා කවුරු වත් ගන්නේ නැහැ. කැලි කඩා යකඩවලට පමණක් ඒවා විකුණන්න පුළුවන්. 99 දී ඒ ගුවන් යානා හතර ඉවත් කළා ම අලුත් ගුවන් යානා ගන්න සල්ලි නැහැ. විශාල අලාභයක් සහ ණය බරක් තිබෙන නිසා.

ඒ නිසා, එයා ලංකා ආයතනයට මොකද කරන්නේ කියා තීන්දු කිරීමට අපට සිදු වුණා., ඉතා විවෘත ව, පැහැදිලි ව, හරියාකාර ව, ක්‍රමානුකූල ව, ටෙන්ඩර් කැඳවා පර්ක් ආයතනය මාර්ගයෙන් අපට ලැබුණු එක ම ශක්තිමත් ඉල්ලුම වූ එමිරේට්ස් එයාවේස් සමාගම සමඟ එයා ලංකා සම්බන්ධ කළා.

පාර්ලිමේන්තුවේ සිටින ව්‍යාපාරික මන්ත්‍රීවරයෙක් කොන්ටිනෙන්ටල් එයාවේස් එකක් ගැන කතා කරනවා. ඔහු මේ ගැන බොහෝ ම උරණ වී කතා කරනවා. ඔහු අසනවා කොන්ටිනෙන්ටල් කියන්නේ එමිරේට්ස්වලට වඩා බොහෝ ශක්තිමත් සමාගමක්, ඇයි ඒ සමාගමට එයා ලංකා නුදුන්නේ කියා. කොන්ටිනෙන්ටල් එයා ලයින් කියන්නේ ඇමරිකාවේ ප්‍රාදේශීය ගුවන් සේවා සමාගමක්. 1991 දී බංකොලොත් වී ඇමරිකන් ව්‍යාපාරික නීතිය යටතේ බංකොලොත් භාවය ප්‍රකාශ කර වහන තත්වයට ආපූ සමාගමක්. ඒත්, එමිරේට්ස් ආයතනය පසුගිය වසර ගණනාවක් ඇතුළත කිහිප වතාවක් ම ලෝකයේ හොඳ ම ගුවන් සේවා සමාගම හැටියට, තෝරාගත් සමාගමක්. කොන්ටිනෙන්ටල් එයාලයින් එක අපිට නියම යෝජනාවක් ඉදිරිපත් කර තිබුණේ නැහැ. ඒ සමාගම කීවේ එයා ලංකා එකේ කොටස්වලින් 60% ක් ඒ අය තියාගෙන 40%ක් අපිට දෙනවා කියලා. ඒ සමාගම කීවේ අපට වැඩි අයිතිය දෙනවා නම් අපි එනවා කියා. අපේ වැඩි දෙනෙක් අධ්‍යක්ෂක මණ්ඩලයේ ඉන්න ඕනැ, අපිට වැඩි අයිතියක් අවශ්‍යයි, එහෙම නැත් නම් අපි මේ ගිවිසුමට කැමැත්තක් නැහැ කියා ඒ අය කීවා. එ තැනින් ඒ අය සමඟ ගනුදෙනු නතර වුණා. අපට

පිළිගත හැකි යෝජනාවක් ගෙනා එක ම ඉල්ලුම්කරුවා වුණේ එමිරේට්ස් ගුවන් සමාගම විතරයි. එයා ලංකා සමාගම ගොඩගන්න පුදුසු ම ඉතා මත් හොඳ සමාගමක් මෙය. මා මේ පිළිබඳ පෞද්ගලික ව විස්තරාත්මක ව බලලායි එකහ වුණේ. එයා ලංකා සමාගම සම්බන්ධ ව ගත යුතු හොඳ ම පියවරයි අපි අරගෙන තිබෙන්නේ. තව වසර 2කින් එහි ප්‍රතිඵල මේ රටේ ජනතාවට දැකගන්න පුළුවන්.

*ප්‍රශ්නයඃ ඔබතුමියගේ ස්විට්සර්ලන්ත ගමන?*

*ජනාධිපතිනියඃ* ඒ කතාව ඇත්තට ම විහිළුවක්. මා ස්විට්ස්ර්ලන්තයට ගියේ පසුගිය අප්‍රේල් 27 වැනි දා. මාස 8කට පෙර දීයි. තුන් වන ලෝකයේ වැඩි සාර්ථකත්වයක් ඇති ව සෞඛ්‍ය ක්‍රමය ක්‍රියාත්මක වන රටක නායිකාව වශයෙන් ලෝක සමුළුවක් ඇමතිමට ආසියානු සංවර්ධන බැංකුව මට ආරාධනා කර තිබුණා. එය මම භාර ගෙනත් මස 7කට වැඩි වුණා. ඒ වන විට එයාලංකා ගනුදෙනුව කතා කරගැනීමට හෝ ඒ කටයුත්ත ඉවර කිරීමට හැකි වේ දැයි හෝ අපි දැන හිටියේ නැහැ. ස්විට්සර්ලන්තයේ මා හිටියේ දවස් 1 1/2යි. ගිය දවසට පසු දා මගේ දේශනය කර, ඊට පසු දා වෙනත් රටකට ගිහින්, ඊට පසු ලංකාවට ආවා. ඊට පසු ව මම ස්විට්සර්ලන්තයට ගියේ නැහැ.

ස්විට්සර්ලන්තයේ බැංකු තිබෙන්නේ කොහේ ද කියා මා දන්නේ නැහැ. ලෝකයේ කොහේ වත් බැංකු ගිණුම් මට නැහැ. ඔය කියන අයගේ නම් බැංකු ගිණුම් පුරවා තිබෙනවා කියා ආරංචියි. ඇත්ත වශයෙන් මගේ ලංකා බැංකුවේ තිබෙන ගිණුම හැරෙන්නට ලංකාවේ වෙන කොහේ වත් ගිණුමක් නැහැ. අවුරුදු 28ක් පමණ පැරණි ගිණුමක් ඒ. ඒ වගේ ම නිට්ටඹුවේ මගේ අක්කර 35න් ලැබෙන ආදායම තැන්පත් කිරීමට නිට්ටඹුවේ ලංකා බැංකුවේත්, හැටන් නැෂනල් බැංකුවේත්, ගිණුමක් තිබෙනවා. කෙ සේ වෙතත් මේ අවුරුදු 4ක කාලය ඇතුළත හෝ මගේ දේශපාලන ජීවිතයේ දී මට ලැබුණු පඩිය රු. 24000යි. ඒ හැරෙන්න මා ශත පහක් වත් හම්බ කර නැහැ. මගේ අම්මාගෙන් තාත්තාගෙන් ලැබූ ආදායමෙන් තමයි මම මගේ දරුවන්ටත් මටත් වියදම් කරන්නේ.

ප්‍රශ්නය: යුද්ධය අතර සිදු වන ගනුදෙනුවල දී ඔබතුමියටත් යම් යම් චෝදනා, ඇඟිලි දික් කිරීම් පසුගිය කාලයේ අහන්න ලැබුණා.

ජනාධිපතිනිය: ආරක්ෂක අංශයේ මිල දී ගැනීම්වල දී අක්‍රමිකතා විශාල ප්‍රමාණයක් තිබෙනවා කියන චෝදනාව මට ද අහන්නට ලැබී තිබෙනවා. ඇත්ත වශයෙන් ම දූෂණ තිබූ රජයක් යටතේ පසුගිය කාලයේ දී, ආරක්ෂක අංශයේත් දූෂණ රාශියක් තිබුණා. ඒ දූෂණ අවම කරන්න අපිට හැකි වී තිබෙනවා. අනෙකුත් සියලු අංශවල ද, ටෙන්ඩර්වල දී ද, යම් යම් අමාත්‍යාංශවල මිල දී ගැනීම්වලදී ද කොන්ත්‍රාත් දීම්වල දී ද විශාල වශයෙන් තිබූ දූෂණ සියල්ල නැති කරන්නට, අඩු කරන්නට මා පෞද්ගලික ව සම්බන්ධ වීමෙන් හැකි වුණා. ආරක්ෂක අංශයේ රහස්‍ය තත්වය නිසා ම මෙය පාලනය කිරීමේ දී ටිකක් අපහසුතාවක් තිබෙනවා. ඒත්, පුළුවන් තරමින් නොයෙකුත් විධිමත් කිරීම් මම කර තිබෙනවා. පොදුවේ මිල දී ගැනීම් සඳහා පළමු වතාවට ටෙන්ඩර් පටිපාටිය පිළිබඳ පොතක් මුද්‍රණය කෙරෙව්වා. අවු: 150 ක පරිපාලන ක්‍රමයක් යටතේ මා මුදල් ඇමතිවරිය වුණාට පස්සේයි, එ වැන්නක් සිදු වුණේ. ටෙන්ඩර් ක්‍රමය නොයෙක් විදියට විධිමත් කර තිබෙනවා. ඊයේ පෙරේදා මා කැබිනට් මණ්ඩලයට කැබිනට් පත්‍රිකාවක් ගෙනාවා, කොමිස් අපේක්ෂකයන්ගේ කටයුතු සීමා කිරීමට ආරක්ෂක අංශයට සම්බන්ධ සමහර අයගේ නම් මේවාට සම්බන්ධ කර තිබුණා ළඟ දී පත්තරවලින් දැනගන්න ලැබුණා. සමහර පත්තර නම් මා හඳුන්වන්නේ කුණු බක්කි පත්තර හැටියටයි. සතිපතා ගහන පත්තර කෑලි තිබෙනවා. මං ඒවා කියවන්නේ නැහැ. ඒත්, පෙරේදා මගේ නම සඳහන් කර තිබෙන බව මට කිහිප දෙනෙක් කීව නිසා මා ඒ අදාළ පත්තර වල කෑලි ගෙනත් බැලුවා. සුමල් පෙරේරා කියා නමක් ඒවායේ සඳහන් කර තිබෙනවා. මා ඔහු අඳුනනවා ලු ; මගේ හොඳ මිත්‍රයෙක් ලු. ඒ අය කවුද කියාවත් මා දැක නැහැ. මේ අය ආරක්ෂක අංශයට අවි ආයුධ සැපයූ බවට අපට ආරංචි ලැබී තිබෙනවා. මාත් සොයා ගෙන යනවා. රහස් ඔත්තු සේවා තිබෙන්නේ ද අපේ අතේ. අපි මොනවා ද වෙන්නේ කියා බලනවා. ආරක්ෂක අංශයේ දූෂණ කරන්නේ මෙ වැනි ප්‍රධාන අය බව මා රටට කියනවා. මේ සිදුවීම් පසුගිය කාලයේ විශාල වශයෙන් සිදු වුණා. මේ කාලෙත්

එක්තරා දුරකට සිදු වෙනවා, මා පරීක්ෂණ ගණනාවක් කර තිබෙනවා.

අපි ගත් සමහර භාණ්ඩවලට විශාල ප්‍රමාණයක් වැඩියෙන් ගෙවන්න මේ කොමිස් නිසා අපිට සිදු වී තිබෙනවා. මේ ප්‍රමාණය ද එකතු වන්නේ රජයේ බිලටයි. මෙය සීමා කිරීමට, මම සෑහෙන කාලයක් ගත කර තිබෙනවා, මා විශ්වාස කරන නිලධාරීන් සමග.

එක් දෙයක් මට කිව හැකියි. ආරක්ෂක අංශයේ රහස්‍ය භාවය නිසා ම, අනෙක් අංශවලට වඩා ටිකක් අමාරු වුණාට අපි එක්තරා දුරකට දූෂණ සීමා කර තිබෙනවා. ඒත් තව ම දූෂණ සිදු වෙනවා.

සුමල් පෙරේරා කියන පුද්ගලයා සල්ලි මිටියක් බත්දේසියක් උඩ තබා මට බාර දෙන පින්තූරයක් කුණු බක්කි පත්තරයක තිබුණා. මට ඒ මුදල් දුන්නා වාගෙයි ඒ පින්තූරය දාලා තිබෙන්නේ. එහි ලියා තිබුණා මර්චන්ට් බැංක් ශ්‍රී ලංකා කියලා. ඒ ලංකා බැංකුවට අයිති තවත් බැංකුවක්. ඒ බැංකුවේ නව ගොඩනැගිල්ලක් විවෘත කිරීමකට මා පසුගිය අවුරුද්දේ හෝ ඊට පෙර අවුරුද්දේ හෝ ගිය අවස්ථාවේ දී වූ දෙයක් ලෙස මෙය ඉදිරිපත් කර තිබෙනවා. සාමාන්‍යයෙන් බැංකුවක් විවෘත කරන අවස්ථාවේ දී, පළමු වන තැන්පතුකරු තම තැන්පතු මුදල ආරාධිත අමුත්තාගේ අතට දෙනවා. ඊ ළඟට ආරාධිත අමුත්තා ඒ මුදල බැංකු නිලධාරියකු අතට දෙනවා. නිලධාරියා රිසිට් එකක් දෙනවා. ආරාධිතයා ඒ රිසිට් එක තැන්පතුකරුට දෙනවා. මේ සුමල් පෙරේරා කියන කොමිස් ගන්නා පුද්ගලයා ද මුළු රට ම, ආරක්ෂක අංශය ම දූෂණය කරන පුද්ගලයා ද කියා මා දැන හිටියේ නැහැ. රටේ ජනාධිපති ගිය විට මෙහෙම කෙනෙක් තෝරා ඉදිරිපත් කෙරුවේ ඇයි ද කියා නිදහසට කරුණු අහලා මම ඒ බැංකුවේ නිලධාරීන්ට දැන් ලියා තිබෙනවා. මට ඒ ගැන තව ම පිළිතුරු ලැබී නැහැ.

*ප්‍රශ්නයඃ මම මරදානේ අල්හාජ් එම්. කේ. මුහාරක් අලි. ළඟ දී පාර්ලිමේන්තුවේ දී ගරු නියෝජ්‍ය මුදල් අමාත්‍යතුමා ප්‍රකාශ කළ පරිදි භාණ්ඩ හා සේවා බද්දෙන් තව වෙන තුරු පාරිභෝගිකයාට කිසිදු සහනයක් ලැබී නැහැ. උදහරණයක් වශයෙන් ආහාර ද්‍රව්‍යවලට සේවා*

*බද්දක් නැහැ කියා තිබෙනවා. ඒත්, පොදු ජනතාව වශයෙන් අපි භාණ්ඩ ගන්න ගියොත් අපට දැනෙන්නේ නැති ව එගෝග ම දාලා තිබෙනවා. ළඟ දී අපි ගිය සාමාන්‍ය හෝටලයක එගෝග ම දාලා තිබුණා. ඒ අයගෙන් ඇසූ විට ඒ අය කීවේ, ඒ අය බදු ගන්නා තැනින් ඒක අය කරනවා කියායි.*

ජනාධිපතිනිය: ජනතාවගේ එදිනෙද ජීවිතයට අත්‍යවශ්‍යයි කියන භාණ්ඩවලට, ආහාරවලට සහ තවත් යම් යම් දේවලට G. S. T අය කරන්නේ නැහැ. ඒත්, දැන් කලින් දුරකථනයෙන් කතා කළ කෙනා කතා කරන්නේ හෝටලයක් ගැන. හෝටලය කියන්නේ ආහාර වෙළඳාම් කරන තැනක්. කඩයකට ගිහින් හාල්, පොල්, එළවළු, පරිප්පු වැනි දේ අරගෙන ගෙදර ගෙනිහින් උයා ගෙන කන විට G. S. T අය කරන්නේ නැහැ. ඒත්, ඒ ආහාර ද්‍රව්‍ය අරගෙන පිහලා හෝටලයක තියාගෙන විකුණන විට ඒ වෙළඳාම සඳහා G. S. T ගෙවන්න ඕනැ. ඒ සේවා බද්දක්. G. S. T අය කරන්නට පෙරත් හෝටල්වලින්, රෙස්ටූරන්ට්වලින් පිරිවැටුම් බද්දක් අය කළා. ආහාර ද්‍රව්‍ය විකුණන කඩවලත් G. S. T අය කරනවා කියා අපට විටින් විට ආරංචි ලැබී තිබෙනවා. මෙ තැන කෙරෙන්නේ තනිකර ම හොර වැඩක්. ඒ කඩ අයිතිකරුවන්, ඒ ව්‍යාපාරිකයින් ගසාකෑමක් කරගන්න බලනවා.

*ප්‍රශ්නය: ඩබ්ලිව්. පී. වික්‍රමසූරිය, කිරිකැටිය පාර, වලස්මුල්ල: ගරු ජනාධිපතිනියගෙන් අපි අහන්නේ මේ දිනපතා බඩු මිල වැඩි වීමේ, තේරුම කුමක් ද කියලයි? අපට මතක හැටියට නම් කලින් සාධාරණ මිල කොමිසම, මිල පාලන දෙපාර්තමේන්තුව, වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ දෙපාර්තමේන්තුව වගේ ආයතන 7ක් තිබුණා. බඩු මිල වැඩි කරන්න කොම්පැනිකාරයකු ඉල්ලූ විට සාධාරණ ව බඩු මිල වැඩි කිරීමට අවසර දෙන්නේ. ඒ ආයතන හත එකතු වෙලා සාකච්ඡා කිරීමෙන් පස්සෙ. මේ රජය අයවැය ලේඛනයේ දී එය ගිලිහී තිබෙන බව අපට පෙනී යනවා. මේ 12 1/2% බද්දක් අය කරන්නේ පාරිභෝගිකයන්ගෙන්. ඉතින් මේ කොම්පැනිකාරයනුයි රට පාලනය කරන්නේ. ගරු නියෝජ්‍ය මුදල් අමාත්‍යතුමා කියන දේ එයින් බොරු*

*වෙනවා. ඔහු කියනවා පාරිභෝගිකයාට බදු පටවන්නේ නැහැ කියලා. ඒත්, මේ 12 1/2 ක බද්ද දැන් පාරිභෝගිකයාට පටවා ඉවරයි. අපිට මේ ගැන තොරතුරු දැන ගැනීමට අවශ්‍ය වී තිබෙනවා.?*

ජනාධිපතිනිය: පාරිභෝගිකයන් ආරක්‍ෂා කිරීමට යම් යම් රාජ්‍ය ආයතන තිබුණා. ඒවා අදත් තිබෙනවා. ඒවා හැම ද ම නිෂ්ක්‍රියයි. මොකද ඒවාට බලතල මදි. මේ රටේ මිල පාලනය කිරීම කව දවත් ඒවා හරි හැටි ක්‍රියාත්මක වුණේ නැහැ. ඒවා ඉතා මත් දුර්වල, බලතල නැති ආයතන. දැන් තැනින් තැන තිබූ එ වැනි ආයතන ගණනාවක් එකට එකතු කරලා මිල පාලනය ශක්තිමත් කිරීමේ ආයතනයක් ගොඩනැගීමට අවශ්‍ය විධි විධාන යොද තිබෙනවා. එක පැත්තකින් ඒවා හෙට අනිද්දා ම නීතිගත කරනවා. අනෙක් පැත්තෙන් ඒ නීතිය ක්‍රියාත්මක කරන්න වෙළඳ අමාත්‍යාංශයේ දැනට මත් හදා තිබෙනවා අධීක්‍ෂණ දෙපාර්තමේන්තුවක්. ජනතාවට ඕනෑ ම වේලාවක එ තැනට කථා කිරීමට පුළුවන්. පැය විසි හතර පුරා ඕනෑ ම වෙලාවක එ තැනට කතා කර, මෙන්න මේ ආයතනය මේ විදියට සූරා කනවා කියා කීමට පුළුවන්. එ වැනි දෙයක් ගැන අධීක්‍ෂණය කිරීමට වහා ම නිලධාරින් යවනවා. ඇත්ත වශයෙන් එ වැනි වැරැදි කර තිබේ නම් ඒ වසා දමන තත්වයට ගෙන එන්නට අපි දැන් කටයුතු කරගෙන යනවා. ළඟ දී ම එය ක්‍රියාත්මක කරනවා.

ඇත්ත වශයෙන් ම අලුතින් ඕනෑ ම දෙයක් ක්‍රියාත්මක වන විට, මේ වගේ පුළුල් ව රට පුරා ක්‍රියාත්මක වන දෙයක් කරන විට අක්‍රමිකතා කිරීමට යම් යම් අය බලනවා. ඒවා පාලනය කිරීමයි රජයේ වගකීම. ඒ අපි ඉතා ඉක්මනට පාලනය කරනවා. ඒත්, අපි ජනතාවගෙන් ඉල්ලා සිටිනවා ඒ ආකාරයේ වැරැදියට මේ G. S. T බද්ද පාවිච්චි කරන අය ගැන කරුණාකර දැනුම් දෙන්න. අපි දැන් එයට අවශ්‍ය නීතිරීති හදාගෙන යනවා.

මෙ තෙක් කල් ශක්තිමත් නීතිරීති තිබුණේ නැහැ. අලුත් ආයතන හදලා තිබෙනවා. එ වැනි අයට එරෙහි ව වහා ම කටයුතු කිරීමට, දඬුවම් කිරීමට අපි සූදනම්.

ප්‍රශ්නය: කුකුල් පාලනය පිළිබඳ පාලිත සිරිලාල්, තුපර පාර, කඩවතින්. පොල්, කොප්පරා සුළු කර්මාන්තයක යෙදෙන කුරුණෑගල ඉන්දිකගෙන් ද, හලාවත ධීවර සමුපකාර සමිතියකින් හලාවතින් ද ලිපියක් ලැබී තිබෙනවා. මේ අයගේ කර්මාන්තවලට අවශ්‍ය දේ පිටරටින් ආනයනය කිරීමේ දී මේ භාණ්ඩ හා සේවා බද්ද අය කිරීම නිසා විශාල ප්‍රශ්න රැසකට මුහුණ දීමට මොවුන්ට සිදු වී තිබෙනවා. ඔවුන්ගේ සුළු ව්‍යාපාර පවත්වාගෙන යාමට නොහැකි වී තිබෙනවා?

ජනාධිපතිනිය: කුකුල් පාලනය මේ රටේ කඩා වැටෙන්ට පටන් ගත්තේ G. S. T දාන්නට කලින්නුයි. හේතුව පසුගිය රජය විසින් තෙල් හා මේද සංයුක්ත මණ්ඩලය, දූෂිත පරිදි සිංගප්පූරු කොම්පැනියකට භාර දීම. ප්‍රීමා කොම්පැනිය, සීදුවේ තෙල් හා මේද සංයුක්ත මණ්ඩලය මාර්ගයෙන් කුකුල් කෑම සම්බන්ධ ව සම්පූර්ණ ඒකාධිකාරිත්වයක් ගොඩනගාගෙන තිබෙනවා. කුකුල් කෑම ඉතා අයථා පරිදි වැඩි මිලට විකුණන්න පටන් අරගෙන. මෙයින් නැති වුණේ මේ රටේ සුළු කුකුල් ව්‍යාපාරයේ යෙදී සිටි ජනතාව. ගිය වසරේ මුල් හරියේ දී ඒ ඒකාධිකාරය ඇති වුණේ එජාප ආණ්ඩුවෙන් වැරැදි විදියට පෞද්ගලික කරණය කළ නිසා. ඒ අයගේ වැරදිත් හරිගස්සන්න අපට සිදු වෙලා. එයට අවශ්‍ය කටයුතු කරන්න දැන් අපි යෙදී ඉන්නවා. ඒත්, G. S. T එකට මෙය කිසි ම සම්බන්ධයක් නැහැ. හැම ලෙඩේට ම හේතුව G. S. T කියන එකත් වැරැදියි.

ප්‍රශ්නය: නුගේගොඩ රූපසිරි පෙරේරා: වසර 2005 දී ලෝක සාගතයක් ඇති වීම පිළිබඳ ව විද්වතුන් දැනට මත් අනතුරු අඟවා තිබෙනවා. මෙ සේ තිබිය දීත්, දේශීය කෘෂිකර්මාන්තය හොඳට ම අඩාළ වෙලා. ආහාර නිෂ්පාදනය පිළිබඳ ලංකාවේ කිසි ම සැලැස්මක් නැහැ. වී අස්වැන්න නෙළන කාලයට පිටරටින් හාල් ගේනවා, අර්තාපල් වගා බිම් ප්‍රමාණය අක්කර 20, 000න්, 2000ට බැහැලා. අනෙකුත් අහාර බෝග ඊටත් අන්තයි. කෘෂිකර්මය පිළිබඳ ව පැහැදිලි සැලැස්මක් තිබෙන බවක් පෙනෙන්න නැහැ. මේ පිළිබඳ ව ඔබට කිව හැක්කේ කුමක් ද?

ජනාධිපතිනිය: ඉතා කෙටියෙන් කීවොත් අපි කෘෂිකාර්මික රටක්. දැන් අපි එ තැනින් හුහාක් ඈත් වෙමින් සිටිනවා. අපි වසර 3000ක පමණ කාලයක් තිස්සේ සියලු ම රජයන්, මේ රටේ නිදහසෙන් පස්සේ සියලු ම රජයන් කෘෂිකර්මයට මුල් තැන දුන්නා. සියලු ම රජයන්ගේ කෘෂිකර්ම සැලසුම් තිබුණා. ඒත්, 1977 සිට 97 අතරතුර කෘෂිකාර්මික සැලසුම් සම්පූර්ණයෙන් ම අත ඇර දමා තිබුණා. ඒ යුගයේ දී වැඩියෙන් ම විනාශ වූ අංශය වුණේ කෘෂිකර්මය. කිසි ම සැලැස්මක් නැති ව ඉදිරියට ගියා. කෘෂිකර්මය පිළිබඳ සැලසුම් කිරීමට ද අපිට සිදු වුණා. ඒත්, මෙයට ටිකක් කල් ගියා. කෘෂිකර්මය කියන්නේ ටිකක් සංකීර්ණ ක්ෂේත්‍රයක්. මාස 8කට 10කට පෙර පැහැදිලි කෘෂිකර්ම සැලැස්මක් අපි සකස් කළා. 97 අයවැය ලේඛනයෙන් යම් යම් සෑහෙන පුළුල් පහසුකම් සහ සහනාධාර ඒ මත අපි ලබාදුන්නේ, ඒ සැලැස්ම ඉදිරියට ගෙනයාම සඳහා.

ඒ සැලැස්ම ගැන මේ රටේ ජනතාව තව මත් දැනුවත් කර මදි බව මා පිළිගන්නවා. ඒ සැලැස්ම ළඟදී ම මුද්‍රණය කර ජනතාවට ලබාදීමට සූදානම්, ජනතාවගේන් අදහස් ලබාගැනීමට. ජනාධිපති කාර්ය සාධක බලකාය ඇතුළු ව, දි. මු. ජයරත්න ඇමතිවරයා, විශේෂඥ නිලධාරීන්, පෞද්ගලික අංශයේ විශේෂඥයන් විශාල සංඛ්‍යාවක් හා ගොවි ජනතාව සම්බන්ධ වෙලයි මෙය හැදුවේ. මා හිතන්නේ මෙය විවෘත ආර්ථික ක්‍රමය යටතේ කෘෂිකර්මය ඉදිරියට ගෙනයාමට හොඳ සැලැස්මක් බවයි. කෘෂිකර්මය ඉදිරියට ගෙන යන්නේ කොහොම ද කියා ද පැහැදිලි හොඳ අදහස් විශාල ප්‍රමාණයක් එහි තිබෙනවා. එහි මුල් කොටස් පසුගිය අයවැයෙන් ක්‍රියාත්මක කිරීමට දැනට මත් පටන්ගෙන තිබෙනවා. ඒත්, වේගය මදි, ක්‍රියාකාරිත්වය මදි. ඒවා ඉතා ඉක්මන් කළ යුතුයි. මෙය ඉතා වේගවත් කිරීමට මා පෞද්ගලිකව ම කටයුතු කරගෙන යනවා. ඉදිරි වසර 2 නිම වෙන කොට කෘෂිකර්ම ක්ෂේත්‍රය ඉතා හොඳ අතට ගේන්න පුළුවන් වෙනවා.

අල ගොවීන් 15000ක් 20000ක් පමණ ඉන්න බව මට දැන ගන්නට ලැබී තිබෙනවා. අල අස්වනු කාලයේ දී පිට රටින් අල ගේනවා

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

කියන එක වැරදි මතයක්. මේ රටේ ජනතාවට අවශ්‍ය තරමට අල කවදවත් නිෂ්පාදනය කරලා නැහැ. මෙහි අල හිඟයක් තිබෙනවා. මුළු ආසියාවේ ම අල නිෂ්පාදන වියදමට වඩා මේ රටේ අල නිෂ්පාදන වියදම ඉතා මත් වැඩියි. ඉන්දියාවේ අල කිලෝ 1ක් රු. 2 කට නිෂ්පාදනය කරනවා, නමි ලංකාවේ රු. 28ක් යනවා. අල හිඟයක් තබාගෙන රු. 50/ 80/ 100/ 150 ට අල කිලෝවක් විකිණීමට අල නිෂ්පාදනය කරන පවුල් 15000ට නැත් නම් 20000ට ඉඩ තබනවා ද, නැත් නම් අල කැමට ගන්නා මේ රටේ ලක්‍ෂ 180කට අඩු මිලට අල ලබා දීම සඳහා අඩුවෙන් ලබාගත හැකි තැන්වලින් අල ගෙනවිත් දෙනවා ද කියන මේ මහා ගැටලුවට අපට මුහුණ දීමට වෙනවා. මේ ගැන පැය ගණන් දින ගණන් අපි කැබිනට් මණ්ඩලයේ සාකච්ඡා කළා. මා පෞද්ගලික ව කෘෂිකාර්මික ඇමති සමඟ, වෙළඳ ඇමති සමඟ, සහ නිලධාරීන් සමඟ, විශේෂඥයන් සමඟ, මුදල් අමාත්‍යාංශයේ නිලධාරින් සමඟ සාකච්ඡා කරලයි තීන්දු ගත්තේ. අල ගොවීන් ආරක්‍ෂා කිරිමත් අවශ්‍යයි. අල ගොවීන් 15000ක් ආරක්‍ෂා කරන අතරේ මේ රටේ මිලියන 18ක් ජනතාවට අඩු මිලට අල දෙන්නත් ඕනෑ. මෙයට එක විසඳුමයි තිබෙන්නේ. ඉතා කෙටියෙන් කීවොත් මේ රටේ අල නිෂ්පාදන වියදම අඩු කරන්නට ඕනෑ. අඩු කිරීමට තිබෙන ප්‍රධාන ම මාර්ගය අල වගාවේ ඵලදායීතාව වැඩි කිරීමයි. අල නිෂ්පාදන ඵලදායීතාව වැඩි කළ ගමන් මීට වඩා අඩු මිලකට අල දෙන්න අල ගොවීන්ට පුළුවන්. අන්න එතකොට ලෝක වෙළඳ පොළෙන්, ඉන්දියාවෙන් එන අල සමග තරගකාරී ව අල ලබා දී හොඳ ලාභයක් ලබා අල විකිණීමට ඔවුන්ට හැකි වෙනවා.

*ප්‍රශ්නය: ඊට සැලැස්මක් තිබේ ද?*

*ජනාධිපතිනිය:* ඊට සැලැස්මක් තිබෙනවා. ලංකාවේ හොඳ බීජ අල නැහැ. හොඳ බීජ අල දී අඩු මිලට පොහොර ලබාදීමේ ක්‍රමයක් හදන්න ඕනෑ. අපි දැන් පොහොරවලට විශාල සහනාධාරයක් ලබා දෙනවා.

*ප්‍රශ්නය : මම තිලකරත්න දිසානායක ගම්පහ: ලෝක බැංකු ණය ආධාර ගැනීම මත එම බැංකු නියෝග අනුව ම මෙ රට පාලන*

*තන්ත්‍රය ක්‍රියාත්මක වන බවක් පෙනෙන්නට තියෙනවා. අසල් වැසි ඉන්දියාව ද ලෝක බැංකු ආධාර ලබා ගන්නා මුත් එහි නියෝග පිළිපැදීමට සූදානමක් නොමැති බව ඒ රට අගමැතිවරයකු එක් අවස්ථාවක පවසා තිබණා. ඒ රට ස්ථාවරය ඒ සේ නම්, ලෝක බැංකු ණය ආධාර මත යැපීමේ හේතුවෙන් ශ්‍රී ලංකාවේ අනාගතය කොහොම වේ වි ද?*

***ජනාධිපතිනිය:*** පළමුවෙන් ම ප්‍රශ්නය ඇසූ පදනම සම්පූර්ණයෙන් ම වැරදියි. ලෝක බැංකු ආධාර ලබා ගැනීමේ දී ලෝක බැංකුව අපිට කිසි ම දෙයක් නියෝග කරන්නේ නැහැ. අපි ස්වාධීන ස්වෛරී රජයක්. අපි මේ රටේ ස්වෛරී භාවය ආරක්ෂා කරන රජයක්. අපි කිසි සේත් ලෝක බැංකු නියෝගවලට ඇහුම් කන් දීමට සූදනම් නැහැ, ඒ අපට සුදුසු නැත් නම්. ලෝක බැංකුවේ නියෝග මත නො වේ අපි අපේ ආර්ථික සැලැස්ම තීන්දු කෙරුවේ. අපි බලයට එන්නට පෙර පොදු පෙරමුණේ, අපේ පක්ෂයේ මැතිවරණ ප්‍රකාශයේ අපේ ආර්ථික ප්‍රතිපත්තිය කුමක් ද කියා මූල ධර්ම වශයෙන් සඳහන් කර තිබෙනවා. මේ මූලධර්ම මත බලයට ඇවිල්ලයි මුදල් අමාත්‍යවරයා හැටියට මම රටට ම ප්‍රකාශයක් කළේ පාර්ලිමේන්තුවේ දී. ඊට පසු ව විටින් විට අපි ඒ ගැන කතා කර තිබෙනවා. මේ රටේ ආර්ථිකයේ විනාශය වැළැක්වීමටත්, ආර්ථිකය ඉදිරියට ගෙනයන්නටත්, ජනතාවට එක පැත්තකින් වැඩි ආදායම් ලබා දීමටත්, එක පැත්තකින් රැකියා ලබා දීමටත්, රට සංවර්ධනය කිරීමටත් අවශ්‍ය ආර්ථික ප්‍රතිපත්තිය කුමක් ද කියා තීන්දු කරලයි අපි ආර්ථික ප්‍රතිපත්තිය හැදුවේ. මේ ආර්ථික වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න මේ රටේ මුදල් මදි. එතකොට අපට වඩා පොහොසත් රටවලින් අපි විදේශ ආධාර ලබා ගන්නට ඕනැ. ඒ විදේශ ආධාර සියල්ල සම්බන්ධීකරණය කරන්නේ ලෝක බැංකුවෙන්. ලෝක බැංකුව අපිට මුදල් දෙන්නේ නැහැ. ඒ ඒ රටවලින් අපිට මුදල් දෙන්නම් කීවාම, ලෝක බැංකුව හරහායි ඒ මුදල් එන්නේ. ඒක තමා ලෝකයේ පවතින ක්‍රමය. මෙය එක්සත් ජාතීන්ගේ සංවිධානයට සම්බන්ධ ක්‍රමයක්. ලෝක බැංකුව සමහර විට රටවලට උපදෙස් ලබා දෙනවා. එහි ලෝකයේ ඉන්න ඉතා හොඳ ආර්ථික

විශේෂඥයින් ඉන්නවා. ආර්ථික හා නොයෙක් අංශවලට ඒ අය උපදෙස් දෙනවා මේ මුදල් ලබාදීමට කටයුතු කරන අය හැටියට. ඒ උපදෙස් ගන්නවා ද නැද්ද කියා තීන්දු කරන්නේ අපි. සමහර දේවල් ලෝක බැංකුව කියන්නට පෙර අපි තීන්දු කර ඉවරයි. එ තැන දී ලෝක බැංකුවේ අදහස් ද ඒ හා සමානයි. සමහර තැන්වල දී මෙහෙම කළොත් හොඳයි නේ ද කියා ලෝක බැංකුව අහන කොට අපි ඊට එකඟ නැත් නම් බැහැ කියනවා. ලෝක බැංකුව හෝ කිසිදු විදේශ රටක් හෝ කිසි ම විදේශ ආයතනයක් හෝ කළ කිසි ම යෝජනාවකට පොදු පෙරමුණු ආණ්ඩුව එකඟ වෙලා නැහැ, ඒවා රටේ යහපතට හේතු වන හොඳ ම යෝජනා බව පෙනුණෙ නැත් නම්.

*ප්‍රශ්නයඃ ලයනල් සිරිවර්ධන පල්ලේගමුව හණකිරිගල සිටඃ මේ රටේ සුළු රබර් වගා හිමියන් ආර්ථික පැත්තෙන් ඉතා ඛේදජනක මට්ටමකට ඇද වැටී සිටිනවා. මේ තත්වය තරමක් වත් හොඳ තත්වයකට ගෙන ඒමට පිළියමක් නැද්ද?*

ජනාධිපතිනියඃ ඇත්ත වශයෙන් ම අප බලයට ආපසු තේ මිල විශාල ලෙස වැඩි වෙලා. කුඩා තේ ගොවීන්ට සහ ලොකු සමාගම්වලට යන සියලු දෙනාට ආර්ථික වශයෙන් මෙය රුකුලක් වී තිබෙනවා. රබර් මිල ද වැඩි වුණා. ඒත්, පසුගිය මාස හයේ දී , හතේ දී රබර් මිල විශාල වශයෙන් අඩු වී තිබෙනවා. රබර් මිල අඩු වීමට එක ම හේතුව, අපි පත්තරවලින් දැකපු විදියට, නැගෙනහිර ආසියාවේ, මැලේසියාව, ඉන්දුනීසියාව, තායිලන්තය වැනි රබර් නිෂ්පාදනය කරන රටවල ආර්ථිකයන් කඩාවැටීම. මා හිතන්නේ තව මාස ගණනකින්, මේ වර්ෂය අවසන් වන විට රබර් මිල නැවත වැඩි වෙන්න ඕනැ. පසුගිය අයවැය ලේඛනයෙන් රබර් ආශ්‍රිත කර්මාන්තවලට අපි විශාල වශයෙන් සහනාධාර ලබාදුන්නා. බංකොලොත් ආර්ථිකයක් ද අතේ ඇති ව සහනාධාර රාශියක් අපි ලබා දී තිබෙනවා. දැනට මේ රටේ වැඩි හරියක් කෙරෙන්නේ නිෂ්පාදිත රබර් ෂීට් පිට රටට විකිණීමයි. රබර් ආශ්‍රිත නිෂ්පාදන කිරීමට කර්මාන්ත ශාලා හැදුණොත් රබර් මිල ඉබේ වැඩි වෙනවා.

*ප්‍රශ්නය: (ඒ ප්‍රශ්නකරුගෙන් ම) පිටරටින් ඉතා වටිනා රෙදි ආනයනය කිරීම පෙහෙකම් හල් වැසියැමට එක් හේතුවක්. මේ නිසා එ වැනි වටිනා රෙදිපිළි ආනයනය නැවැත්විය නොහැකි ද?*

**ජනාධිපතිතිය:** ලංකාවේ නිෂ්පාදනය කරන රෙදි ප්‍රමාණය කිසි සේත් ම මේ රටේ අවශ්‍යතාවලට ප්‍රමාණවත් නැහැ. මේ රටේ රෙදි නිෂ්පාදනය වන්නේ ඉතා සුළු රෙදි ප්‍රමාණයක්. මේ රටේ රෙදි නිෂ්පාදනය කරන සමාගම් තිබෙන්නේ 100ක් පමණයි. මේ සමාගම්වලින් වැඩි හරියක් ඉතා සුළු ඒවා. මේවායේ සේවක සංඛ්‍යාව 18000ක් පමණයි. මේ රෙදිවල ගුණාත්මකතාව ඉතා මත් පහත්. අපි 94 දී බලයට එන විට රෙදි නිෂ්පාදන කර්මාන්ත අංශය කඩා වැටිලයි තිබුණේ. හැම අයවැයෙන් ම විශාල ප්‍රමාණයේ සහනාධාර රෙදි නිෂ්පාදකයන්ට ලබාදුන්නා. රුපියල් මිලියන 400ක 500ක සහනාධාර. මේ රෙදි නිෂ්පාදකයින් කළ යුතු දේවල් ද තිබෙනවා. ඒ අයගේ කර්මාන්ත ශාලා, යන්ත්‍ර උපකරණ නවීකරණය කළ යුතුයි. අද ලෝකයේ රෙදි නිෂ්පාදන හා සමාන්තර වීමට නම්, හොඳ රෙදි නිෂ්පාදනය කරන්න නම්, කම්හල් නවීකරණය කළ යුතුයි. මේ අය එ සේ කිරීමට සූදානම් වුණේ නැහැ.

*ප්‍රශ්නය: ඒ අයට සහන, යම් යම් ආධාර දීම් තිබෙනවා ද?*

**ජනාධිපතිතිය:** මේ අය වැයට පෙර මිලියන 500ක් පමණ ආධාර ලබාදුන්නා, ඒත්, ඒ තත්ත්වයෙන් ගොඩ එන්නට ඒ අයට ශක්තියක් තිබුණේ නැහැ. මේ රටේ පාරිභෝගිකයන්ට හොඳ රෙදි ලබා නො දී ඉන්න අපට බැහැ. ඒ අයට හොඳ රෙදි ලබාගැනීමේ අයිතියක් තිබෙනවා. අපි අනෙක් පැත්තෙන් රෙදි නිෂ්පාදන කරන කර්මාන්ත ශාලාකරුවන්ට සහනාධාර විශාල ප්‍රමාණයක් මේ අය වැයෙන් ලබා දුන්නා. පාරිභෝගිකයාට ලෝක වෙළෙඳ පොළේ හොඳ ම රෙදි ඉතා මත් අඩු මිලට ලබාගැනීම සඳහා ආනයන සහනාධාර දුන්නා. ඒ නිසා, මේ රටේ රෙදි මිල ඉතා විශාල වශයෙන් අඩු වී තිබෙනවා. අනෙක් පැත්තෙන්, මේ රටේ රෙදි නිෂ්පාදනය කිරීමේ යෙදී සිටින ඒ සුළු ප්‍රමාණයට සහනාධාර රාශියක් ලබා දී උදවු කෙරුවා. ඇත්ත වශයෙන් මේ අපේ වගකීමක් නො වෙයි. පසුගිය ආණ්ඩුව කාලයේ ගෙවාගන්න බැරි ව ගොඩගැසුණු බැංකු ණයට සහනාධාර දී, ඒ

අයගේ කළමනාකාරිත්වය නවීකරණය කිරීමට අවශ්‍ය සහයෝගය දී, පිටරට තත්වයට ලංකාවේ රෙදි නිෂ්පාදනය කිරීමේ පසුබිමක් අපි දැන් ඇති කර තිබෙනවා. ඒ නිසා මේ අංශය කඩා වැටෙන්නේ නැහැ.

*ප්‍රශ්නය: උපුල් තෙන්නකෝන් මැදවච්චියේ සිට: විරැකියාව අද ශ්‍රී ලංකාවේ උග්‍රතම ප්‍රශ්නයක්. උපාධිධාරීන් පමණක් 30000ක් රැකියා නොමැති ව සිටිනවා. රාජ්‍ය අංශයේ සංකෝචනය වීම නිසා තව දුරටත් රජයේ රැකියා ගැන බලාපොරොත්තු තියාගන්න බැහැ. සම්පූර්ණ විශ්වාසය පෞද්ගලික අංශය කෙරෙහි තැබීමට අද සිදු වී තිබෙනවා. පෞද්ගලික ආයෝජකයන් ප්‍රමාණවත් තරම් පැමිණියේ නැත් නම් ඒ ප්‍රශ්නය විසඳෙන්නේ කෙ සේ ද?*

*මේ දිනවල හඩ නගන සමෘද්ධි නියාමකයන්ගේ තත්වය කෙ සේ ද යන්නත් මේ සමග දැන ගැනීමට කැමැතියි.*

*ජනාධිපතිනිය:* උපාධිධාරීන් ගැන කියන ගණනේ දී නම් එය දෙකෙන් බෙද 3000ක් පමණ අඩු කළ විට රැකියා විරහිත උපාධිධාරීන්ගේ ගණන ලැබේ වි. ඒ කියන්නේ රැකියා නොමැති උපාධිධාරීන් මේ රටේ ඉන්නේ 10000ක් 11000ක් පමණයි. ඒකත් ඉතා මත් නරක තත්වයක්. මේ රටේ ජනතාව අපට බලය ලබා දුන්නේ අවුරුදු 6කටයි. රැකියා විරහිත ව සිටි සියයට 13.3 සියයට 10 දක්වා පළමු වන අවුරුදු 3 ඇතුළත අඩු කර තිබෙනවා. අප බලයට එන විට O/L, A/L, සහ උපාධිධාරීන් 850,000ක් රැකියා අපේක්ෂාවෙන් හිටියා. හැම වර්ෂයක් පාසා ම තව 130000ක් 150000ක් මේ ගණනට එකතු වෙනවා. 150000 බැගින් ගත් විට මේ වසර තුනට 4, 50000ක්, එ විට 1300000ක්. ඒ ගණන ලක්ෂ 6 1/2 ක් දක්වා අඩු කිරීමට පුළුවන් වී තිබෙනවා. 0/Lවලට පහළ ඉගෙනීම ලැබූ තවත් විශාල ප්‍රමාණයක් රැකියා විරහිත ව හිටියා. මේ අයගෙන් සෑහෙන ප්‍රමාණයකට ද රැකියා දී තිබෙනවා. රැකියා විරහිත භාවය විශාල ප්‍රශ්නයක් හැටියට රැකියා නැති කෙනකුට පේනවා. ගමේ පස් දෙනකුට රැකියා ලැබුණ විට, 100ක් රැකියා අපේක්ෂාවෙන් ඉන්නා විට, ඉතිරි 95 දෙනාට ම මෙය විශාල ප්‍රශ්නයක් වෙනවා. ඒත්, අපිට

එක දවසෙන් දෙකෙන් රැකියා ඇති කරන්න බැහැ. ශක්තිමත් ආර්ථිකයක් තුළ පහසුවෙන් මුදල් ලබාගන්නා ආර්ථිකයක් තුළ ඒ මුදල් ලබාගෙන රජයේ ආයතන හදන අතරේ රැකියා අවස්ථා උදාකර දෙන්න පුළුවන්. පෞද්ගලික අංශයේ අලුත් ව්‍යාපෘති ආරම්භ කිරීමෙන්, සංවර්ධන කටයුතු කිරීමෙන් නව රැකියා අවස්ථා ඇති කරන්න පුළුවන්. ඒ සඳහා ආර්ථිකය ශක්තිමත් කළ යුතුයි. අපි දැන් කිව්වා වගේ ඒ ටික කර තිබෙනවා. දැන් නව ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් මේ වසරේ දී ආරම්භ වී තිබෙනවා. පෞද්ගලික අංශයේ කර්මාන්ත ශාලා, ඊට අමතර ව යටිතල පහසුකම් වශයෙන් ප්‍රධාන පාරවල්, වරාය, විදුලිය, පාසල්, ගුවන් තොටුපළ, විශාල කර්මාන්ත පුර, රෙදි මසන කර්මාන්ත ඉදිවෙමින් තිබෙනවා පමණක් නො වෙයි, ඉහළ තාක්ෂණය භාවිත කරන කර්මාන්ත පුර වැනි මේ සියල්ල දැන් ඉදිවෙමින් පවතිනවා. මේ වසරේ අවසානයේ 99 ලබන විට අපිට විශාල වෙනසක් දකින්න පුළුවන්. නව දහදහස් ගණනාවකට රැකියා ලබාගැනීමට මේ නිසා හැකි වෙනවා.

***ප්‍රශ්නය: ජනාධිපතිතුමියනි, ගොවි නියාමකයින්, සමෘද්ධි නියාමකයන් යන මේ අය දිගු කාලයක් බැට කාලා, ඔබතුමියගේ රජය පත් කිරීමට විශාල කැප වීමක් කළ පිරිසක්. මොවුන්ගේ ප්‍රශ්න ගැන මවුන් ඔබතුමියගෙන් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.?***

**ජනාධිපතිනිය:** සමෘද්ධි නියාමකයන් බොහොම තරුණ අයයි. රජය බලයට පත් කිරීමේ දී බැට කෑවේ ඒ අය ම නො වේ, ඒ අයගෙන් කොටසකුත් එහෙම බැට කෑවා. අනෙක් අය හුහක් වැඩිහිටි අය. මේ සමෘද්ධි නියාමකයින් ඔවුන්ගේ දූ දරුවන්, ඥාති මිත්‍රාදීන් වෙන්න පුළුවන්. සමෘද්ධි නියාමකයින් ඇත්ත වශයෙන් ම මේ රටේ විශාල වැඩ කොටසක් කර තිබෙනවා. සමහරු වැරදි කර ද තිබෙනවා. ඒ අය ගැන වෙන වෙන ම කටයුතු කිරීමට අපට සිදු වෙනවා. සමෘද්ධි නියාමකවරුන් විසි දහස් ගණනක් ඉන්නවා. යුද්ධයක් කරද්දීත් මේ වසර අවසන් වීමට පෙර මේ අයගෙන් 14000ක් ස්ථිර කිරීමට අපි කටයුතු ආරම්භ කර තිබෙනවා.

වැරදි කළ සෑහෙන ප්‍රමාණයකට විරුද්ධ ව කටයුතු කිරීමට අපිට සිදු වෙනවා. අනෙක් අය ඊ ළඟ වසරේ දී ස්ථිර කිරීමට කටයුතු කිරීමට අපි බැඳිලා ඉන්නවා.

රට විනාශ කරන දේශපාලන සංවිධාන හා මේ අය සම්බන්ධ වූ පළියට, ගහෙන් ගෙඩි කඩනවා වගේ මේ කටයුත්ත කරන්නට බැහැ. පත් කරලා, පුහුණු කරලා ලබාදෙන රු. 2000 දීමනාවට අමතර ව නොයෙකුත් ප්‍රතිලාභ ලැබීමට ඒ අයට අවස්ථා ලැබී තිබෙනවා. යම් යම් කොන්ත්‍රාත් අරගෙන කිරීමට ඔවුන්ට නීත්‍යනුකූල ව අවසර දී තිබෙනවා. මේ නිසා, මේ අයගෙන් දක්ෂ හැම දෙනා ම මාසකට රුපියල් දහකට වැඩි ප්‍රමාණයක්, හම්බ කර ගන්නවා. දැන් ස්ථිර කරන්න කියා ඔවුන් ඉල්ලීමක් කරනවා. එය සාධාරණයි. අපි මේ අයගෙන් 1/2 කට වැඩි ප්‍රමාණයක්, 14000ක් ඒ කියන්නේ 60%ක් පමණ ස්ථිර කිරීමට දැන් කටයුතු කරගෙන යනවා. රජය අස්ථිරතාවට පත් කරන දේශපාලන පක්ෂ ගොඩනැගීමට හදන කඩාකප්පල් කටයුත්තක් මිසක්, සමෘද්ධි නියාමකයන්ට මෙ තැන කිසිදු ප්‍රශ්නයක් නැහැ.

*ප්‍රශ්නය : මම නටාශා ලියනගේ පහ වසර ඉගෙනුම ලබන්නේ : ඔබතුමිය කුඩා දරුවන්ට ගොඩක් ආදරෙයි. ඉතින් අපේ රටේ කුඩා දරුවන්ගේ කලා දක්ෂතා දියුණු කිරීමට වැඩ පිළිවෙළක් සකස් කරනවා නම් මා කැමතියි?*

*ජනාධිපතිනිය:* ඇත්ත වශයෙන් ම කුඩා දරුවන්ගේ කලා දක්ෂතා පමණක් නො වෙයි, කුඩා දරුවන්ට හොඳ අධ්‍යාපනයක් අවශ්‍ය වෙනවා. එතැනින්නුයි අපි පටන්ගත යුත්තේ, කලාව කියන්නේ අධ්‍යාපනයේ කොටසක් විතරයි. අපි ඒ සියල්ල වර්ධනය කිරීම සඳහා මේ රටේ නව අධ්‍යාපන වැඩපිළිවෙළක් ආරම්භ කර තිබෙනවා. මා හිතන හැටියට අපේ රජයෙන් කරගෙන යන සාර්ථක ම කටයුත්තක් මේ. අපි අධ්‍යාපනය සකස් කරනවා. මේ ශත වර්ෂයේ දී ඉදිරියට ගමන් කළ සමාජයට, ආර්ථිකයට සරිලන පරිදි අපේ අධ්‍යාපනය


මෙතෙක් කල් සකස් වී තිබුණේ නැහැ. ඒ කතා කළ කුඩා දරුවාට මෙන් ම මේ රටේ පාසල් දරුවන් ලක්ෂ 42ට ම, ඔවුන්ගේ ජීවිත සාර්ථක කරගන්නට සාර්ථක අධ්‍යාපනයක් ලබාදීමට හැකි වේය කියා මා විශ්වාස කරනවා.

*ප්‍රශ්නය: ජනාධිපතිතුමියනි, මේ රටේ ජනතාව ඔබතුමියගේ රජය පිළිබඳ අනාගතය පිළිබඳ, අනාගත සැලසුම් පිළිබඳ මේ වසර හතර ඇතුළත මේ රටේ ජනතාව නගන ප්‍රශ්නවලින් හෙළි වන්නේ මොනවා ද?*

*ජනාධිපතිනිය:* ඇත්ත වශයෙන් මට තේරුණ විදියට, ඉතා කෙටියෙන් කියනවා නම් අපි ගම්වලට යන විටත් ඔය වැනි අදහස් ඉදිරිපත් වෙනවා. ජනතාවගේ තදබල අවශ්‍යතාවක් තිබෙනවා, ක්ෂණික ව තමන්ගේ සහ රටේ ආර්ථික තත්වය ඉතා ඉක්මනින් වර්ධනය කරගන්නට. ඒ හිතන තරම් ඉක්මනින් වර්ධනය කිරීමට නොහැකි වුණේ මේ ආර්ථිකය කඩා වැටීම නිසයි. ඒත්, අනාගතය ඉතා මත් සුභදායක යයි කිව හැකියි. යුද්ධයක් කරමින් සිටිය දී, රටේ ජනතාවගෙන් අතිවිශාල සහයෝගයක් ලැබුණ නිසා, කැපවීම් රාශියක් කිරීමට ජනතාව සූදනම් ව සිටි නිසා, මේ කෙටි කාලය ඇතුළත ශක්තිමත් ආර්ථිකයක් හදන්නට පුළුවන් වී තිබෙනවා. යුද්ධයක් කරද්දීත් රජයේ සේවකයින්ගේ ලක්ෂ 10 ක විතර පඩි වැඩි කළා. 50%ක් පමණ පඩි වැඩි කර, ශක්තිමත් ආර්ථිකයක් හදා, රැකියා විරහිත භාවය අඩු කරමින් සිටිනවා. රටක සංවර්ධනයක් සඳහා අවශ්‍ය වන යටිතල පහසුකම් පාරවල්, විදුලිය, විදුලි සංදේශ, වාරිමාර්ග, වරාය , ගුවන් තොටුපළ වැනි දේවල් සංවර්ධනය කිරීමට කිසි ම සැලැස්මක් අපි බලයට එන විට තිබුණේ නැහැ. ඒ යටිතල පහසුකම් ශීඝ්‍රයෙන් ආරම්භ කිරීමට දැන් වැඩ කටයුතු ආරම්භ කර තිබෙනවා. ව්‍යාපෘතියක් සැලසුම් කර, යෝග්‍යතා වාර්තා හදා, ලෝකයේ හැම තැන ම ගිහින් ඒවාට ආධාර හොයාගෙන ඇවිත් වැඩ පටන් ගැනීමට අඩු තරමින් වසර 2 1/2 ක් 3ක් යනවා. අපි දැන් ඒ ටික කර තිබෙනවා. අපි බලයට එන විට එ වැනි විශාල ව්‍යාපෘතින්

සඳහා සංවර්ධන සැලසුම් තිබුණේ ද නැහැ. විශාල රැකිරක්ෂා ප්‍රමාණයක්, රැකි රක්ෂා දහදහස් ගණනක් ඒ ව්‍යාපෘති තුළින් ලබාදීමට පුළුවන්. දැන් ඒ කටයුතු ද අපි ආරම්භ කර තිබෙනවා. ඒ නිසා, අවසන් වශයෙන් මට කිව හැකියි, ශක්තිමත් ආර්ථිකයක් ඇති ආසියාවේ සංවර්ධිත රටක් හැටියට, 21 වැනි ශත වර්ෂයට පා තබන්නට අපට ස්ථිර ව ම හැකි වෙනවා කියා.

ජනාධිපති ලේකම් කාර්යාලය
25 AUG 2023
පුස්තකාලය



ප්‍රකාශන අංශය

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව